# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව


**2024 නොවැම්බර්**
**06 වෙළුම 11 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2024 වසරේ නොවැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 994ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.5කින් සුළු වශයෙන් පහළ ගියේය.

2024 වසරේ නොවැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,496ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.7කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)





2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පිළිවෙළින් සියයට 7.0කින් සහ සියයට 10.4කින් ඉහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2023 වසරේ නොවැම්බර් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 390ට සාපේක්ෂව 2024 වසරේ නොවැම්බර් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 502ක් දක්වා පුළුල් විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2024 ජන. - නොවැ.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.- නොවැ.)




### අපනයන පරිමා හා මිල දර්ශක - (ජන.- නොවැ.)





2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී ප්‍රධාන වශයෙන් කාර්මික නිෂ්පාදිත අපනයන කාණ්ඩයන්හි ආදායම ඉහළ යෑම හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අපනයන ආදායම ඉහළ ගියේය.


2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී , පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සියයට 12.4කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 4.8කින් පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.- නොවැ.)




### තේ සහ රබර් මිල ගණන්





*2024 මැයි සහ අගෝස්තු මාස සඳහා රබර් (ආර්එස්එස්) මිල ගණන් වෙන්දේසියේදී තීරණය කර නොමැත.


2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී, ප්‍රධාන වශයෙන් තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ කුළුබඩු අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, මෙම කාලපරිච්ඡේදය තුළ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු ආහාර අපනයන ආදායම පහළ යෑමක් සිදුවිය.

## කාර්මික අපනයන


කාර්මික අපනයන ආදායම





කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය
(ජන.- නොවැ.)





නැව් හා ගුවන් යානා ඉන්ධනවල
අපනයන මිල ගණන්





2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. තවද, රෙදිපිළි හා ඇඟලුම්, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ රබර් නිෂ්පාදිත අපනයනයන්හි සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ; යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ප්‍රවාහන උපකරණ අපනයන ආදායමෙහි පහළ යෑමක් පැවතුණි.

## ආනයන ක්‍රියාකාරිත්වය

ආනයන ක්‍රියාකාරිත්වය
(ජන.- නොවැ.)





ආනයන පරිමා හා මිල දර්ශකය - (ජන.- නොවැ.)





සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ආනයන පරිමා දර්ශකය සියයට 16.7කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 5.4කින් පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.- නොවැ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





තෙල් හා මේද, ගෘහ උපකරණ, සහ එළවළු ඇතුළු ආහාර හා පාන වර්ග සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන ඉහළ යෑම හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, කිරි නිෂ්පාදිත සහ සීනි ආනයන වියදමෙහි පහළ යෑමක් සිදු විය.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



## අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- නොවැ.)




## බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික අගයන්හි සාමාන්‍ය)





* 2023 වසරේ පෙබරවාරි,සැප්තැම්බර් සහ 2024 අගෝස්තු මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.


2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදිත, මූල ලෝහ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන ඉහළ යෑම හේතුවෙන් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ඉන්ධන ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

# ආයෝජන භාණ්ඩ ආනයන


## ආයෝජන භාණ්ඩ ආනයන වියදම




## ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




## ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- නොවැ.)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසාන වන මාස එකොළහ තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | නොවැ. 2023 | නොවැ. 2024 | වෙනස (%) | ජන. -නොවැ. 2023 | ජන. - නොවැ. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **214.8** | **228.0** | **6.1** | **2,359.9** | **2,517.9** | **6.7** |
| එයින් | තේ | 112.8 | 118.2 | 4.7 | 1,198.8 | 1,304.3 | 8.8 |
| | පොල් | 28.7 | 32.7 | 14.0 | 313.6 | 380.5 | 21.3 |
| | කුළුබඩු | 30.9 | 40.7 | 31.7 | 361.6 | 407.9 | 12.8 |
| | මුහුදු ආහාර | 25.2 | 16.5 | -34.6 | 238.4 | 212.8 | -10.7 |
| **කාර්මික අපනයන** | | **765.4** | **762.9** | **-0.3** | **8,486.8** | **9,105.3** | **7.3** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 396.2 | 398.0 | 0.5 | 4,439.0 | 4,613.4 | 3.9 |
| | රබර් නිෂ්පාදිත | 77.2 | 75.1 | -2.8 | 824.1 | 897.2 | 8.9 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 55.2 | 70.0 | 26.9 | 478.3 | 975.5 | 104.0 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 50.3 | 51.2 | 1.8 | 495.0 | 594.0 | 20.0 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 42.6 | 36.7 | -13.9 | 555.1 | 446.0 | -19.7 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 35.9 | 27.9 | -22.3 | 475.5 | 365.5 | -23.1 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.8 | 4.9 | -15.3 | 66.4 | 57.3 | -13.7 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **18.8** | **3.3** | **-82.6** | **62.2** | **46.9** | **-24.5** |
| **මුළු අපනයන** | | **999.0** | **994.1** | **-0.5** | **10,908.9** | **11,670.2** | **7.0** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | නොවැ. 2023 | නොවැ. 2024 | වෙනස (%) | ජන. -නොවැ. 2023 | ජන. - නොවැ. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **265.2** | **319.6** | **20.5** | **2,771.2** | **3,068.1** | **10.7** |
| ආහාර හා පාන වර්ග | | 133.2 | 164.0 | 23.1 | 1,541.0 | 1,671.8 | 8.5 |
| එයින් | එළවළු (ආ) | 29.3 | 32.4 | 10.5 | 326.5 | 397.4 | 21.7 |
| | සහල් | 1.2 | 1.3 | 10.3 | 16.1 | 40.0 | 149.1 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 132.0 | 155.6 | 17.9 | 1,230.1 | 1,396.3 | 13.5 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 56.6 | 57.6 | 1.8 | 620.3 | 515.1 | -17.0 |
| **අන්තර් භාණ්ඩ** | | **867.8** | **920.1** | **6.0** | **10,058.2** | **10,789.7** | **7.3** |
| එයින් | ඉන්ධන | 316.9 | 310.7 | -2.0 | 4,288.5 | 3,920.4 | -8.6 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 203.2 | 241.6 | 18.9 | 2,188.0 | 2,594.5 | 18.6 |
| | පොහොර | 25.9 | 10.8 | -58.1 | 200.5 | 173.9 | -13.2 |
| | තිරිඟු හා ඉරිඟු | 21.4 | 37.2 | 73.5 | 318.3 | 324.3 | 1.9 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **255.7** | **256.6** | **0.3** | **2,493.2** | **3,059.2** | **22.7** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 168.4 | 168.3 | -0.1 | 1,692.8 | 2,072.8 | 22.4 |
| **මුළු ආනයන** | | **1,388.7** | **1,496.3** | **7.7** | **15,322.6** | **16,916.9** | **10.4** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | නොවැ. 2023 | නොවැ. 2024 | වෙනස (%) | ජන. -නොවැ. 2023 | ජන. - නොවැ. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -389.7 | -502.2 | | -4,413.6 | -5,246.7 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | නොවැ. 2023 | නොවැ. 2024 | වෙනස (%) | ජන. -නොවැ. 2023 | ජන. - නොවැ. 2024 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 139.0 | 138.4 | -0.5 | 138.0 | 147.7 | 7.0 |
| | පරිමා දර්ශකය | 155.0 | 158.9 | 2.5 | 167.0 | 187.7 | 12.4 |
| | මිල දර්ශකය | 89.7 | 87.1 | -2.9 | 82.7 | 78.7 | -4.8 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 124.3 | 133.9 | 7.7 | 124.7 | 137.6 | 10.4 |
| | පරිමා දර්ශකය | 127.6 | 139.0 | 8.9 | 128.7 | 150.2 | 16.7 |
| | මිල දර්ශකය | 97.4 | 96.4 | -1.0 | 96.9 | 91.6 | -5.4 |
| **වෙළඳ මිල අනුපාතය** | | 92.1 | 90.3 | -1.9 | 85.3 | 85.8 | 0.6 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ඇණ, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද

ජාත්‍යන්තර වෙළඳාම සහ වෙළඳ භාණ්ඩ අධ්‍යයන අංශය /ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව